# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා මැදිරි තුනක් සහිත සැහැල්ලු දුම්රියක් මෙරට තුළදී එකලස් කිරීම සඳහා ප්‍රසම්පාදනය

## SRS/F. 8155

01. ශ්‍රී ලංකාවේ කොළඹ, තැ.පෙ. 355, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන්, ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ යෝජකවරුන් වෙතින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා මැදිරි තුනක් සහිත සැහැල්ලු දුම්රියක් මෙරට තුළදී එකලස් කිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. මෙම අභිලාෂය ප්‍රකාශ කිරීම්, ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය අදියර දෙක කවර දෙක ක්‍රමවේදය තුළින් පවත්වනු ලැබේ.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ යෝජකයන්හට වැඩිදුර තොරතුරු ලබා ගැනීම සහ ලංසු ලිපි ලේඛන පරීක්ෂා කොට බැලීම 2026.06.08 දින සිට 2026.06.30 දින දක්වා වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත ලිපිනයේදී සිදු කළ හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **+94(11) 2438078 හෝ +94(11)4600202** |
| **ෆැක්ස් අංකය** | : | **+94(11) 2432044** |
| **ඊමේල්** | : | **srs.slr@gmail.com.tender1.srs@gmail.com** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

04. පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළහැකි අදාළ යෝජකයන්, පුද්ගලයන් ලෙස හෝ බද්ධ ව්‍යාපාර ලෙසට යෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබති.

i) අදාළ යෝජක ප්‍රධාන සැකසුම් වැඩ, නිෂ්පාදන හෝ රථවාහන එකලස් කිරීමේ කාර්යයන්හි ශ්‍රී ලංකාවේ විධිමත්ව ලියාපදිංචි කළ සමාගමක් හෝ බද්ධ ව්‍යාපාරයක් විය යුතුය.

ii) යෝජක වෙත මෙවන් ව්‍යාපෘති සම්බන්ධව රජයේ ආයතන හෝ ප්‍රසිද්ධ සමාගම් වෙත සාර්ථකව ව්‍යාපෘති සේවා ලබාදීමේ වසර පහක (05) පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ සම්බන්ධ ප්‍රමාණවත් විස්තර යෝජනා සමග ඉදිරිපත් කළ යුතුය.

iii) යෝජක විසින් සමාන ස්වභාවයේ බර ලෝහ සැකසුම් නිෂ්පාදන හා බර වාහන හෝ දුම්රිය මැදිරි එකලස් කිරීමේ හැකියාව සනාථ කිරීම සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

05. සියලුම යෝජනා සමග යෝජනා ඇපකරයක් බැගින් තිබිය යුතුය. එම යෝජනා ඇපකරයේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 8,000,000.00 විය යුතු අතර, එය කොන්දේසි විරහිත හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් නිකුත් කළ එකක් විය යුතුය.

06. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 96,000.00 ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන යෝජකයන්හට 2026.06.08 දින සිට 2026.06.30 දින ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

07. මේ සම්බන්ධ පෙර - යෝජනා රැස්වීමක්, 2026.06.17 දින පෙ.ව. 10.00 ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II 7 වන මහල, ප්‍රවාහන මාහමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවැත්වීමට නියමිතය.

08. අදාළ යෝජනා පහත සඳහන් ලිපිනය වෙත 2026.07.01 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,**
**07 වන මහල, සෙත්සිරිපාය අදියර II,**
**බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**

ප්‍රමාදවී ලැබෙන යෝජනා ප්‍රතික්ෂේප කෙරේ. ලැබී ඇති යෝජනා 2026.07.01 දින ප.ව. 2.00 ට ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල සෙත්සිරිපාය අදියර II, 7 වන මහල, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ සම්මන්ත්‍රණ කාමරයේදී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන යෝජකයන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව.**